| | | |
|---|---|---|
| **2025**<br>ජූලි | # ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය<br>නිෂ්පාදන සහ සේවා | STATISTICS DEPARTMENT<br>CENTRAL BANK OF SRI LANKA |

## 2025 ජූලි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.

**නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, ඉහළ වේගයකින් වර්ධනය වූ අතර, 2025 ජූලි මාසයේ දී එය දර්ශකාංක 62.2ක අගයක් වාර්තා කළේය.** මෙම වර්ධනය සඳහා සියලුම උප දර්ශක ධනාත්මකව දායක විය.

නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශකවල වර්ධනයට ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් අංශවල ඉහළ ගිය ක්‍රියාකාරිත්වය ප්‍රධාන වශයෙන් සහාය විය. තවද, ජූලි මාසයේ දී සේවා නියුක්ති උප දර්ශකය කඩඉම් මට්ටමින් ඉහළට පැමිණි අතර, නිෂ්පාදන සහ නව ඇණවුම්වල ඉහළ යෑම අනුව යමින් තොග මිලදී ගැනීම් උප දර්ශකය ද තවදුරටත් ඉහළ ගියේය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මාසය තුළ දී ඉහළ ගියේය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **51.9** | **62.2** | **+** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නව ඇණවුම් | 50.5 | 67.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 52.6 | 66.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 49.0 | 55.0 | + | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 50.5 | 59.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 58.2 | 55.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ගෝලීය වෙළඳාමේ අවිනිශ්චිතතාවයන් පිළිබඳ අවධානය යොමු වුවද, නිෂ්පාදන අංශයේ ඉදිරි මාස තුන පිළිබඳ අපේක්ෂා ධනාත්මකව පවතී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

**2025 ජූලි**

**62.2**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| එක්සත් ජනපදය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 අගෝස්තු 15 වන දිනට (PMI Releases (spglobal.com))*

[1] *එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සේවා ක්‍රියාකාරකම්වල වේගවත් වර්ධනයක් පෙන්නුම් කරමින් 2025 ජූලි මාසයේ දී දර්ශකාංක 70.1ක් වාර්තා කළේය.**

ව්‍යාපාර ක්‍රියාකාරකම් 2025 ජූලි මාසයේ දී ඉහළ යෑම සඳහා බොහෝ අංශවල සිදු වූ වර්ධනයන් හේතු විය. ඒ අනුව, තොග සහ සිල්ලර වෙළඳාම හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් ජූලි මාසය තුළ දී සැලකිය යුතු ලෙස වර්ධනය විය. තවද, ණය දීම් ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය සේවා හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉහළ ගිය අතර භාණ්ඩ ප්‍රවාහනය හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් ද අඛණ්ඩව වර්ධනය විය. තවද, අනෙකුත් පෞද්ගලික සේවා, තැපැල් කටයුතු, රූපවාහිනී වැඩසටහන් සකස් කිරීම හා විකාශනය, විදුලි සංදේශ, නවාතැන් හා ආහාර සැපයීම සහ මහජන සෞඛ්‍යය ආශ්‍රිත ව්‍යාපාර ක්‍රියාකාරකම් ද ජූලි මාසය තුළ ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය.

ප්‍රධාන වශයෙන්, තොග සහ සිල්ලර වෙළඳාම සහ මූල්‍ය සේවා යන අංශවල සිදු වූ වර්ධනයත් සමඟ, 2025 ජූලි මාසයේ දී නව ව්‍යාපාරවල ඉහළ යෑමක් දක්නට ලැබුණි.

අංශ කිහිපයක ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉහළ යෑම හේතුවෙන් වැඩිවන මෙහෙයුම් ඉල්ලීම් සපුරාලීම සඳහා සමාගම් කිහිපයක සිදු වූ නව බඳවා ගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය 2025 ජූලි මාසයේ දී ඉහළ ගියේය. මේ අතර, නිම කිරීමට නියමිත කාර්යයන් පෙර මාසයට සාපේක්ෂව ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **61.9** | **70.1** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 62.9 | 64.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.6 | 59.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිම කිරීමට නියමිත කාර්යයන් | 50.0 | 51.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 75.8 | 80.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂාවන්, යහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ අඛණ්ඩව වර්ධනය විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**70.1**

**2025 ජූලි**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| **ගෝලීය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **ඉන්දියාව** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **චීනය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් ජනපදය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් රාජධානිය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **යුරෝපා කලාපය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[I] ආයතනය, 2025 අගෝස්තු 15 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.